**ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව- 2018**

-----------------------------------------------------------------

## 1.1 මතය

--------

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ සභාවේ 2018 දෙසැම්බර් දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාවේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,404,477 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.7,790,035 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,194,512 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වර්ෂය තුළ ආබාධිත තැනැත්තන්ට ආධාර ලබාදීම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන් මූලික කරගත් ආධාර වැඩ සටහන යටතේ දුර හා ළඟ පෙනෙන ඇස්කණ්නාඩි 1500 ක්ද ජංගම සේවාවලදී බෙදාහැරීම සඳහා ළඟ පෙනෙන ඇස්කණ්නාඩි 60,000 ක්ද ලබාදීමට ප්‍රතිපාදන සළස්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ දුර හා ළඟ පෙනෙන ඇස්කණ්නාඩි 331 ක් | පිළිගනිමි. පූර්ව වර්ෂයන්හි දුර හා ළඟ පෙනෙන ඇස් කණ්ණාඩි නිකුත් කර ඇති ප්‍රමාණය සලකා බලා 2018 වර්ෂයට ද 1500 ක කණ්ණාඩි ප්‍රමාණයක් අවශ්‍ය බවට පුරෝකථනය කරමින්, ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත. එනමුත්, එම වර්ෂයේ ලැබුණු ඉල්ලීම් ප්‍රමාණය 331කි. එම | අබාධිත පුද්ගලයලයන්ගේ අවශ්‍යතාවයන්ට අනුකූලව ඇස්කණ්නාඩි ලබාදීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පමණක් සහ ළඟ පෙනෙන ඇස්කණ්නාඩි 50,811 ක් මිළදී ගැනීමට රු.8,425,210 ක් වැයකර තිබුණි. මෙම කණ්නාඩිවලින් වෛද්‍ය සහතික පදනම් කර ගෙන ඉල්ලුම් කරන ලද දුර හා ළඟ පෙනෙන ඇස්කණ්නාඩි ලබාදීම පිළිබඳ දැනුවත් කිරීමට ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් නොතිබූ නිසා එම කණ්නාඩි සඳහා ඉල්ලුම අඩුවී තිබුණි. තවද, අඩු ආදායම්ලාභී තත්ත්වය මූලික කර නොගෙන ජංගම සේවා පවත්වන ස්ථානවලදී ළඟ පෙනෙන ඇස්කණ්නාඩි 50,811 ක් බෙදාහැරීමට කටයුතු කර තිබුණි. | ප්‍රමාණය නිකුත් කර ඇත. ළඟ පමණක් පෙනෙන ඇස් කණ්ණාඩි 60,000 ක් ඇණවුම් කර තිබුණද එම වර්ෂය තුළ වරින් වර ඇති වූ පාලන තන්ත්‍රයේ වෙනස් වීම් මත සැලසුම් කරන ලද ජංගම සේවාවන්, නිසි පරිදි පැවැත්වීමට නොහැකි වූබව දක්වා තිබුණි. | |
| (ආ) | වර්ෂය තුලදී ආබාධ සහිත තැනැත්තන්ගේ ජීවන තත්ත්වය උසස්කිරීම සඳහා ස්වයං රැකියා ආරම්භ කිරීමට හෝ වැඩි දියුණු කර ගැනීමට රු.25,000 ක උපරිමයකට යටත්ව පුද්ගලයන් 400 ක් වෙනුවෙන් රු.9,000,000 ක් ප්‍රදානය කිරීමට ඉලක්ක කර තිබුණු අතර සත්‍ය වශයෙන් පුද්ගලයන් 412 ක් වෙනුවෙන් රු.10,053,057 ක් වූ ආධාර ලබාදී තිබුණි. එසේම ආධාර ලබාගැනීමට ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේද ප්‍රගතිය පිළිබඳව මාස තුනකට හෝ අවුරුද්දකට පසුව පසුවිපරම් වාර්තාවක් ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව මහ ලේකම් කාර්යාලය ලබාගත යුතු බවට කොන්දේසියක් ඇතුළත් කර තිබුණද ලබාදුන් ස්වයං රැකියා ආධාර සඳහා වාර්තා 142 ක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | පසුවිපරම් කිරීමේ ක්‍රමවේදය නිසියාකාරව සිදු වී නොමැති බව පිළිගනිමි. එනමුත් මේ වන විට පසු විපරම් වාර්තා 270ක් ලැබී ඇති බව දක්වා තිබුණි. | ආධාර ලබාදීම මෙන්ම එම ආධාර ලද බව සනාථ කර ගැනීමට පසුවිපරම් සිදු කළ යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂවලදී ආරම්භ කරන ලද නමුත් මෙතෙක් වැඩ අවසන් නොකළ නිවාස 366 ක් පැවති අතර ඒ සඳහා රු.25,112,006 ක් වූ වාරික ගෙවිය යුතුව තිබුණි. මෙම ගෙවියයුතු වාරික තුළ දිස්ත්‍රික්ක 15 ක නිවාස ඉදිකිරීම් ආරම්භ කර වර්ෂ 02 ත් වර්ෂ 06 ත් අතර කාලයක් ගතව තිබූ නිවාස 169 ක් සහ | අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන් සඳහා නව නිවසක් ඉදි කිරීමට හෝ නිවස අලුත්වැඩියා කර ගැනීම සඳහා ලබා දෙන උපරිම මුදල පිළිවෙලින් 250,000.00 ක් හා 150,000.00 වේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව ප්‍රමුඛතාගත කර | නිවාස ආධාර ලබාදීමේදී අදාළ වාරික ලබාදීම කඩිනමින් සිදුකල යුතුය. එසේම ප්‍රමාදවීම් සම්බන්ධව පසුවිපරම් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දිස්ත්‍රික්ක 18 ක නිවාස ඉදිකිරීම ආරම්භ කර වර්ෂයකට වඩා වැඩි කාලයක් ප්‍රමාද වූ නිවාස 67 ක ට අදාළව පිළිවෙලින් රු.14,260,000 ක් හා රු.3,400,000 ක්ද ගෙවිය යුතුව තිබුණි. මෙම නිවාස ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය පිළිබඳ විස්තර සහ ඉතිරි මුදල් ලබා නොදීමට හේතු විගණනයට අනාවරණය නොවුණි. | එවනු ලබන අඩු ආදායම්ලාභී පුද්ගල අයදුම්පත්‍ර සඳහා අමාත්‍යාංශය තුළ පිහිටුවා ඇති කමිටුවක් මඟින් පරීක්ෂා කර බලා අනුමැතිය ලබා දුන් පසු ආධාර මුදල් නිදහස් කිරීම සිදු කරනු ලැබේ. මෙම ආධාර මුදල ලබා දීම සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ ඇති කර ගත් ගිවිසුමකින් සුපිරි වාසනා සම්පත ලොතරැයි අලෙවි ආදායමෙන් 5% ක ලාභාංශයක් මේ සඳහා ප්‍රදානය කරයි. ඒ අනුව වාර්ෂිකව ලැබෙන මූල්‍යමය අගය නිශ්චිත වශයෙන් දැක්විය නොහැකි අතර ජාතික ලොතරැයි මණ්ඩලය විසින් එම අගය කිසිදු අවස්ථාවක දන්වා නැත. එමෙන්ම ඉහත කී ආධාර මුදල් ලබා දෙනුයේ දක්වා ඇති කොන්දේසි පාදක කර ගනිමින් වාරික වශයෙන්වන බැවින් අදාල කොන්දේසි සම්පූර්ණ කරන ආකාරය අනුව අනුමත සම්පූර්ණ මුදල නිදහස් කිරීමට මෙවැනි කාලයක් ගත වී ඇත. ඒ අනුව දැනටමත් ගෙවීමට නියමිත ඉතිරි වාරික ගෙවීම් ඉහත කී ආකාරයට කොන්දේසි සම්පූර්ණ කිරීමෙන් පසු ගෙවීමට කටයුතු කරන බව දක්වා තිබුණි. | |
| (ඇ) | ඉකුත් වර්ෂවලදී නිවාස ආධාර ලාභීන්ට මුදල් ආධාර ලබාදීම ප්‍රමාදවීමේ හේතුවෙන් කළුතර, කෑගල්ල, මුලතිව්, අනුරාධපුර සහ මහනුවර යන දිස්ත්‍රික්කවල නිවාස 09 ක් ඉදිකිරීම් සඳහා පළමු වාරික ලෙස රු.723,000 ක් මුදලින් ගෙවීමෙන් පසු විවිධ හේතු මත එම නිවාස ඉදිකිරීම් අත්හැර දමා තිබුණි. මේ සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකරද නොතිබුණි. | පසුවිපරම් කිරීමේ ක්‍රමවේදය නිසියාකාරව සිදු වී නොමැති බව පිළිගනිමි. එනමුත් ආධාරලාභීය මිය යාම, ප්‍රදේශය අතහැර යාම සහ ආධාර ලාභියාට වෙනත් ආකාරයක සුදුසු රැකවරණයක් ලැබීම, ආධාර මුදලෙහි පළමු වාරිකය නිදහස් කළ පසු රජයේ රැකියාවක් ලැබීම සහ ආදායම් මට්ටම රු.6000.00 ට වඩා වැඩි වීම වැනි හේතු පදනම් කර ගනිමින් පළමු වාරිකය ගෙවීමෙන් පසු නිවාස ඉදිකිරීම් සම්බන්ධව ගැටලු සහගත තත්ත්ව උද්ගත වී ඇති බව නිරීක්ෂණය කරන බව දක්වා තිබුණි. | පසුවිපරම් කිරීමේ ක්‍රමවේදය නිසියාකාරව සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ආබාධ සහිත තැනැත්තන්ට නිවාස ඉදිකිරීම සඳහා ආධාර ලබාදීමේදී නියමිත මුදල් වාරික තුනකින් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ලබාදීම සිදුකරයි. කෙසේ වුවද ලේකම් කාර්යාල විසින් වාරික ගෙවා අවසන් කළ ලිපිගොණු පිළිබඳ විස්තර ලේඛණගත නොකිරීමත් හා නිවාස ඉදිකිරීම් නිමකළ බවට ප්‍රාදේශීය ලේකම් හරහා වාර්තා ලබානොගැනීමත් නිසා වැඩ අවසන්කළ නිවාස පිළිබඳ නිශ්චිත විස්තර විගණනයට ලබාගත නොහැකි විය. | පිළිගනිමි. එම ගොනු සියල්ල ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කරන බව දක්වා තිබුණි. | වාර්ෂිකව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබාදුන් මුදල් අදාළ පුද්ගලයන් වෙත ලබාදී නිවාස ඉදිකිරීම අවසන් කර ඇති බව සනාථ කර ගත යුතුය. |
| (ඊ) | ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීම සම්බන්ධයෙන් අවශ්‍ය 2016 අංක 01 දරන ආබාධ තැනැත්තන් සඳහා වූ ප්‍රවේශ නියෝග යටතේ නීති ක්‍රියාමාර්ග ගැනීම සහ ප්‍රවේශ පහසුකම් සපුරාලීම පිළිබඳව පසුවිපරම් හා අධීක්ෂණ කටයුතු මෙන්ම ඒ සම්බන්ධ සියළුම කාර්යයන් හි වගකීම මෙම සභාව වෙත පැවරී තිබුණද, අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් තාක්ෂණ නිලධාරීවරයෙක් මෙතෙක් බඳවා ගෙන නොමැති බැවින් එම කාර්යය සාර්ථකව ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි. | පිළිගනිමි. එනමුත් ප්‍රවේශ පහසුකම් ඉදි කිරීම් පිළිබඳ පසුවිපරම් හා අධීක්ෂණ කටයුතු මේ වන තෙක් නියමිත පරිදි හැකි උපරිමයෙන් ඉටු කර නොමැති බව දක්වා තිබුණි. | ආබාධ තැනැත්තන් සඳහා වූ ප්‍රවේශ පහසුකම් සහිතව ගොඩනැගිලි ඉදි කිරීම් පිළිබඳ නීති ක්‍රියාමාර්ග කටයුතු සිදුකිරීමත් පසුවිපරම් කටයුතු කිරීමත් මහ ලේකම් කාර්යාලයේ ප්‍රධාන කර්තව්‍යක් ලෙස සළකා කටයුතු කල යුතුය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නීති නිළධාරි, තාක්ෂණ නිලධාරී, සංඥා භාෂා පරිවර්තක, ගණකාධිකාරී සහ බ්‍රේල් උපදේශක තනතුර ඇතුළු තනතුරු 16 ක් සඳහා නිලධාරීන් 40 ක් ස්ථිර කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට 2018 මාර්තු 19 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන තිබුණද 2019 ජුනි 31 දින වන විටත් එම නිළධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශයට අනුයුක්ත කාර්යය මණ්ඩලය 26 දෙනෙකු මගින් සභාවේ කටයුතු ඉටුකරමින් පැවතිණි. | ආබාධ සහිත තැනැත්තන් සභා වන ජාතික මහ ලේකම් කාර්යාලයට නිලධාරීන් අනුයුක්ත කිරීම විෂය භාර අමාත්‍යාංශය මඟින් සිදු කෙරෙන අතර මෙම අඩුපාඩුව අවස්ථා ගණනාවකදී අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. අමාත්‍යාංශය විසින් නිලධාරීන් ලබා ගැනීමට අදාල ආයතන වෙත දැනුම් දීම් කර ඇත. එනමුත් මේ දක්වා එම අඩුපාඩු සම්පූර්ණ වී නොමැති බව දක්වා තිබුණි. | ආබාධිතයන් සඳහා සහන සැළසීමෙදී ඒ සම්බන්ධව කටයතු කරන නිලධාරී මණ්ඩලයක් මහ ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ගැනීමට කටයුතු කළ යුතුය. |